**ශීර්ෂය 21 - විගණකාධිපති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 21 - විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 21 දින විගණකාධිපතිතුමා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,185.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,158.1 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 27.7 ක් හෙවත් සියයට 2.3 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,157.65 | 1,138.33 | 19.32 | 1.67 |
| මූලධන | 28.22 | 19.83 | 8.39 | 29.73 |
| **එකතුව** | **1,185.87** | **1,158.16** | **27.71** | **2.34** |

**2.2** **ආදායම් ගිණුම**

**-------------------**

**ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම**

**--------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා 20.03.02.01 ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 110.0 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 109.3 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 99.36 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඌනතාවය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 20.03.02.01 | 110.0 | 109.3 | 0.7 | 0.64 |

**2.3** **අත්තිකාරම් ගිණුම**

**--------------------**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**--------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**--------------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 02101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 36.02 | 45.00 | 54.68 | 280.00 | 218.37 |

**2.4** **පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 24.99 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0132/000 | 0.20 |
| 6000/0000/00/0015/0012/000 | 3.81 |
| 6000/0000/00/0016/0081/000 | 16.06 |
| 6000/0000/00/0018/0084/000 | 4.92 |
| **එකතුව** | **24.99** |

### 2.5 විගණන නිරීක්ෂණය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.130,585 ක්වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.03.02.01 දරන ආදායම් සංකේතයට අදාළව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 214.4 ක ආදායම් හිග හිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 32 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු මහා භාණ්ඩාගාරය විසින් සංශෝධනය කිරීමේදී 2014 වර්ෂයේදී සියයට 9 කින් හා 2015 වර්ෂයේදී සියයට 10 කින් ඇස්තමේන්තුගත ආදායම වැඩිකර තිබුණි.

(ඇ) රජයට අයත්ව තිබූ ආයතන වසා දැමීම්, ඒකාබද්ධ කිරීම්, ප්‍රතිව්‍යුහගත කිරීම්, විකිණීම යනාදි හේතූන් මත දැනට ක්‍රියාත්මක නොවන විගණිත ආයතන 24 කට අදාළව එකතුව රු.6,555,758 ක්වූ විගණන ගාස්තු හිඟහිටව පැවැතුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,921,229 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 3. 4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 352 | 205 | 147 |
| (ii) | තෘතියික මට්ටම | 1,204 | 1,024 | 180 |
| (iii) | ද්විතියික මට්ටම | 183 | 151 | 32 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 183 | 143 | 40 |
| | **එකතුව** | **1,922** | **1,523** | **399** |